**ධීවර ත්‍යාග අරමුදල - 2017**

--------------------------------------

ධීවර ත්‍යාග අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ දහවන කොටසේ 59 (5) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-------------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

-------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුනේ දැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

## 2.1 මතය ව්‍යාචනය

--------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

දිස්ත්‍රික් ධීවර කාර්යාල 13 ක් විසින් අත්අඩංගුවට ගෙන නීත්‍යානුකූල කටයුතු අවසන් වන තෙක් අධිකරණ හා නාවික හමුදාව භාරයේ ඇති අරමුදලේ වත්කම් වශයෙන් හඳුනාගත හැකි යන්ත්‍ර හා උපකරණ පිළිබඳව තොරතුරු ගිණුම්ගත කිරීම සඳහා ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය තුළ වැටලීම් කටයුතුවලින් නඩු පැවරීම් 427 ක් සිදුකර තිබුණත්, ඒ සඳහා දායක වූ නිලධාරීන්ට ගෙවිය යුතු ත්‍යාග දීමනා ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2017 වර්ෂය සඳහා ධීවර ත්‍යාග අරමුදලට රාජසන්තක කරන ලද භාණ්ඩ හා මසුන් විකිණීමෙන් එකතුව රු. 636,009 ක ආදායමක් ලැබී තිබුණ බව සඳහන් වුවද සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල අරමුදලේ ආදායම ලෙස රු.344,465 ක් පමණක් දක්වා තිබුණි. ඒ අනුව රු. 291,544ක පැහැදිලි නොකළ වෙනසක් පැවතුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් ශේෂය ලෙස දක්වා තිබුණු රු.3,305,947 ක ශේෂය තහවුරු කිරීම සඳහා ශේෂ සහතිකයක් විගණනයට ඉදිරිපත් නොවූ අතර ගනුදෙනු සටහන් කරන නාමමාත්‍ර ගිණුමක් පමණක් බව ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් විසින් විගණනයට දන්වා තිබුණි.

### 2.3 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.1,540,073ක් වූ ලැබිය යුතු මසුන් අලෙවි ආදායමෙන් රු.1,327,598ක් හෙවත් සියයට 86.2 ක් 2016 වර්ෂයට පෙර සිට ලැබිය යුතු මසුන් අලෙවි ආදායම් විය. සමාලෝචිත වර්ෂයේ දී 2016 වර්ෂයේ හිඟ ආදායම්වලින් රු. 14,330 ක් පමණක් අයකර ගෙන තිබුණෙන් හිඟ ආදායම් අයකර ගැනීම දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) පුත්තලම දිස්ත්‍රික්කයේ නඩු භාණ්ඩ විකිණීමෙන් ත්‍යාග අරමුදලට 2016 ජූනි 20 දින ලැබී තිබුණු රු.2,725,000කින් සියයට 25 ක් වන රු.681,250 ක් ඒකාබද්ධ අරමුදලට ගෙවා තිබුණේ 2017 දෙසැම්බර් 12 දිනදීය.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.344,465ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,253,095ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.908,630ක පිරිහීමක් විය. 2016 වර්ෂයේදී වැටලීම් සඳහා දායක වූ නිලධාරීන්ට රු. 3.468,750ක් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය තුළ එවැනි දීමනා ගෙවා නොතිබීම හා රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලද ආදායම රු.4,377,380 කින් අඩුවීම ඉහත පිරිහීම සඳහා බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

#### 4.1.1 සැලසුම් කිරීම

----------------

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 59 (2) වගන්තියට අනුව ත්‍යාග අරමුදලේ පරිපාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා වගකිව යුතු වුවද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2016 හා 2017 වර්ෂ සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරි සැලැසුම්වල ත්‍යාග අරමුදලේ කාර්යයන් හඳුනාගෙන ඵලදායි ලෙස ඉටුකර ගැනීම සඳහා සැලැසුම් කර නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

-------------------------------------

නීති අංශය ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව වැටලීම්වලට සහභාගි වූ නිලධාරීන්ට ත්‍යාග මුදල් ලබා දීම අප්‍රමාදව කළ යුතු වුවත් 2014,2015,2016 හා 2017 වර්ෂවල පිළිවෙළින් නඩු පැවරීම් 271ක්,348ක්,488ක් හා 427ක් සිදු කර තිබුණද, 2015 හා 2016 වර්ෂවලදී නඩු පැවරීම් 05 ක් වෙනුවෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ නිලධාරීන් 64 දෙනෙකුට පමණක් රු. 3,826,125 ක ත්‍යාග මුදල් ගෙවා තිබුණි. 2014 හා 2017 වර්ෂ සඳහා කිසිදු මුදලක් ගෙවා නොතිබුණි. මේ අනුව නිලධාරීන් වෙත ත්‍යාග මුදල් ලබා දීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් සකස් නොකිරීම හේතුවෙන් නීති විරෝධී ධීවර කටයුතු මැඩලීම සඳහා නිලධාරින් දිරිගැන්වීමක් සිදු නොවන බව නිරීක්ෂණය විය.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 59 (4) උප වගන්තිය අනුව නිලධාරීන්ට හා තොරතුරු සපයන්නන්හට කලින් කලට සුදුසු යැයි අධ්‍යක්ෂවරයා සලකනු ලබන යම් මුදල් ප්‍රමාණයක් ත්‍යාග අරමුදලින් ගෙවිය යුතු බව දන්වා ඇතත්, තොරතුරු සපයන්නන්හට ත්‍යාග මුදල් ලබා දීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ධීවර කාර්යාල විසින් නීති විරෝධී ධීවර කටයුතුවල නියැලෙන්නන්ට විරුද්ධව නඩු පැවරීම තුළින් අධිකරණය විසින් ධීවර භාණ්ඩ රාජසන්තක කිරීම් මෙන්ම දඩ මුදල් ලෙස රු. 1,890,800ක් සමාලෝචිත වර්ෂය තුළ චූදිතයන්ගෙන් අයකර ගෙන තිබුණි. එහෙත් එසේ අයකර ගනු ලබන දඩ මුදල්වලින් කිසිදු ප්‍රතිශතයක් ධීවර ත්‍යාග අරමුදලට ලබා ගැනීම සඳහා ධීවර හා ජලජ සම්පත් පනතේ කරුණු සංශෝධනය කර නොගැනීම හේතුවෙන් එම දඩ ආදායමෙන් කොටසක් ධීවර ත්‍යාග අරමුදලට ලබාගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) වැටලීම් පිළිබඳ තොරතුරු ලේඛනයක් පවත්වා නොමැති බැවින් 2017 වර්ෂයේ නිති විරෝධි ධීවර කටයුතු සම්බන්ධව දෙපාර්තමේන්තුව විසින් සිදුකර ඇති වැටලීම් පිළිබඳ අනාවරණය කරගැනීමට නොහැකි විය.මේ සම්බන්ධයෙන් 2015 හා 2016 වර්ෂවල සිට විගණන වාර්තා මඟින් දැනුම් දී තිබුණත් ඒ කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුව විසින් නීති වීරෝධී ධීවර කටයුතුවල නියැලෙන්නන්ට විරුද්ධව පවරා තිබු නඩු සම්බන්ධයෙන් වූ නඩු වාර්තා ලබා ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් 2014 වර්ෂයේ විගණන වාර්තාව මඟින් දැනුම් දී තිබුණත් ඒ කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 (i) හා 2011 දෙසැම්බර් 23 දිනැති අංක ඩීඑම්ඒ/06 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව ත්‍යාග අරමුදලේ මුදල් කටයුතු හා කාර්යසාධනය පිළිබඳව පවතින අභ්‍යන්තර පාලන ක්‍රමයට සහභාගී වී එම කටයුතුවල හරි වැරදි හා වංචා වැළැක්වීමට සහ අනාවරණය කරගැනීම සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණනය විසින් සිදුකළ යුතු වුවත්, 2013 වර්ෂයේ සිට ත්‍යාග අරමුදල සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | පොත්පත් පවත්වා ගැනීම | නීතිවිරෝධී ධීවර කටයුතු සම්බන්ධව දෙපාර්තමේන්තුව විසින් සිදුකර ඇති වැටලීම් පිළිබඳ අනාවරණය කර ගැනීම සඳහා වැටලීම් පිළිබඳ තොරතුරු ලේඛනයක් පවත්වා නොතිබීම. |
| (ආ) | නිලධාරීන්ට තෑගි මුදල් ගෙවීම | ත්‍යාග අරමුදල් ගෙවීම් කටයුතු කඩිනම් කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කර නොතිබීම. |
| (ඇ) | මූල්‍ය පාලනය | හිඟ ආදායම් අයකරගැනීම ඉතා දුර්වල තත්ත්වයක පැවතීම. |